සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2025
இரண்டாம் தவணைப் பரீட்சை - 2025 / Second Term Test - 2025

35028

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | ඉතිහාසය - I | කාලය / நேரம் / Time: පැය 01 යි |

නම / பெயர் / Name ..............................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

සැලකිය යුතුයි:

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ **(X)** ලකුණ යොදන්න.

---

1. මහාවංසටීකාව ලෙස සැලකෙන්නේ මින් කවරක්ද ?
   (1) වංසත්තප්පකාසිනී (2) උත්තර විහාරට්ඨකථා
   (3) විනයට්ඨකතා (4) ජාතකට්ඨ කතා

2. කෝට්ටේ යුගයේ ලියැවුණු "පැරකුම්බා සිරිත" කෘතිය අයත් වන්නේ.
   (1) හටන් කාව්‍යයට ය. (2) ප්‍රශස්ති කාව්‍යට ය.
   (3) සංදේශ කාව්‍යට ය. (4) වීර කාව්‍යයට ය.

3. පහත සඳහන් සාහිත්‍ය මූලාශ්‍රය ඇසුරින් මෙරට දේශපාලන තොරතුරු ඇතුළත් මූලාශ්‍රය කුමක්ද ?
   (1) නිකාය සංග්‍රහය (2) රාජාවලිය (3) සමන්තපාසාදිකාව (4) පූජාවලිය

4. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථානයක් වන්නේ
   (1) බෙල්ලන්බැඳිපැලැස්ස යි. (2) පොම්පරිප්පු යි.
   (3) අලිගල යි. (4) පතිරාජවෙල යි

5. පූර්ව ඓතිහාසික යුගයට අයත් ශිලා මංජුසා සොහොන් පිහිටි ස්ථානයක් වන්නේ,
   (1) ගල්සොහොන්කනත්ත ය. (2) බටදොඹලෙන ය.
   (3) පතිරාජවෙල ය. (4) හල්දුම්මුල්ල ය.

6. මහාවංශයේ සඳහන් වන ඓතිහාසික යුගයේ පැවති වාපිගාමයක් නොවන්නේ මින් කුමක්ද ?
   (1) විහාරවාපි (2) මණිකාරවාපි (3) සුමනවාපි (4) කඩහවාපි

7. මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි කළුදියපොකුණ සෙල්ලිපියෙහි ඇතුළත් වන්නේ කුමන කරුණක් සම්බන්ධව ද?
   (1) විහාරයට දානය සපයා ගැනීමේ ගැටලුවක් ඇති වූ විට එය විසඳා ගන්නා ආකාරය
   (2) තොටුපොළෙන් බදු අය කරගන්නා ආකාරය
   (3) ගම්කයන් තිදෙනෙක් විසින් ගල්ලෙනක් පූජා කිරීම සම්බන්ධව
   (4) සුමන නම් රන්කරුවා පිළිබඳව

8. මුලදී පරුමක තනතුර දරා පසුව දුටුගැමුණු රජුගේ සේනාවේ සෙන්පතියෙකු බවට පත්වූ පරුමකවරයා වන්නේ,
   (1) හරණ ය. (2) වසභ ය. (3) ඵුස්සදේව ය. (4) සුරනිමල ය.

9. වල්ලිපුරම් රන්පතට අනුව යාපනය අර්ධද්වීපය හැඳින්වූ පැරණි නාමය කුමක්ද?
   (1) කන්තරෝඩය (2) නකදිව (3) අක නගර (4) නාක නගර

10. කුවේර ලෙස පෙනී සිටි පළමුවන කාශ්‍යප රජතුමා හැඳින්වීමට සෙල්ලිපිවල යොදා ඇති රාජ්‍යත්ව සංකල්පය කුමක්ද ?
   (1) දේවත්ව රාජ (2) බෝධිසත්ත්ව රාජ (3) වීරත්ව රාජ (4) පර්වත රාජ

11. ක්‍රිස්තු වර්ෂ නම වන සියවසට අයත් වන සෙල්ලිපිවල **සභාව** යනුවෙන් හඳුන්වා ඇති ආයතනය කුමක්ද ?
   (1) අධිකරණය (2) එක්තැන්සමිය (3) විධායකය (4) ව්‍යවස්ථාදායකය

12. අනුරාධපුර යුගයේ දී උණ රෝගය වැළඳුණු රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා විශේෂ රෝහලක් ඉදි කළ පාලකයා කවුද?
   (1) iv වන කාශ්‍යප (2) I වන උපතිස්ස (3) v වන මහින්ද (4) බුද්ධදාස

13. අනුරාධපුර රාජධානි සමයේ දී සංක්‍රමණ හා ආක්‍රමණ මෙන්ම වෙළඳ කටයුතුවලදී ද වැදගත් වූ වරාය මින් කුමක්ද ?
   (1) ජම්බුකෝලතිත්ථ (2) මහාතිත්ථ (3) ගෝකණ්ණතිත්ථ (4) සූකරතිත්ථ

14. ස්ථිතික ජලවිද්‍යා මූලධර්මයට අනුව සකස්කර ඇති **ලෝකඩ ඇත් පහන** හමුවූයේ කුමන ස්ථානයකින්ද ?
   (1) දඹදෙණිය (2) පඬුවස්නුවර (3) පුංඛගාම (4) රජගල

15. අතීතයේදී රජුට අයත් ඉඩම්වල වගාකිරීම වෙනුවෙන් ජනතාව විසින් රජයට ගෙවන ලද බද්ද කුමක්ද?
   (1) දකපති (2) මතරමපිබක (3) බොජකපති (4) කෙටුකනබ

16. කිසිදු සතෙකු නොමැරිය යුතු බව ප්‍රකාශ කරමින් **"මාඝාත නීතිය"** පැනවූ පාලකයා කවුරුන්ද ?
   (1) v මිහිඳු (2) නිශ්ශංකමල්ල (3) ii මුගලන් (4) අමණ්ඩගාමිණී අභය

17. **සහස්සවත්ථුප්පකරණය** නම් මූලාශ්‍රයේ සඳහන් වන්නේ පහත සඳහන් කුමන කරුණක් සම්බන්ධයෙන් ද ?
   (1) අතීත කාන්තාව මව්වරු ලෙස ගෞරවාදරයට ලක් වූ බව.
   (2) තම දියණිය සූප ශාස්ත්‍රයේ නිපුණ කිරීම දෙමාපියන් සතු වගකීමක් බව.
   (3) සූප ශාස්ත්‍රයේ දක්ෂ කාන්තාවන් මදූපාචිකා ලෙස හැඳින්වූ බව.
   (4) අතීත කාන්තාව ට සමාජය තුළ දැඩි ආරක්ෂාවක් පැවැති බව.

- පහත වගුවේ A සිට F දක්වා දී ඇති තොරතුරු අධ්‍යයනය කොට 18, 19 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

| රජතුමා | ආක්‍රමණිකයා | ඓතිහාසික සිදුවීම |
|---|---|---|
| A. පරාක්‍රම පාණ්ඩ්‍ය | B. චන්ද්‍රභානු | C. පොළොන්නරු රාජධානියේ අවසාන පාලකයා |
| D. දෙවන පරාක්‍රමබාහු | E. කාලිංගමාඝ | F. තෙමහල් දළදා මැඳුරක් ඉදිකිරීම |

18. පොළොන්නරුව රාජධානිය සම්බන්ධයෙන් තොරතුරු දැක්වෙන පිළිතුරු කාණ්ඩය කුමක්ද ?
   (1) A, E හා C (2) A, B හා F (3) D, E හා F (4) A, E හා F

19. දඹදෙණිය රාජධානි සමය පිළිබඳ නිවැරදි පිළිතුර කුමක්ද ?
   (1) D, A හා C (2) D, B හා F (3) D, E හා C (4) A, E හා C

20. ගම්පොළ රාජධානි යුගයේදී රාජ්‍ය උරුමය ක්‍රියාත්මක වූ ආකාරය වන්නේ,
   (1) පියාගෙන් පසු වැඩිමහල් පුතාට ය.
   (2) රජුගෙන් පසු අගබිසවගේ සොහොයුරාට ය.
   (3) වැඩිමහල් සහෝදරයාගෙන් පසු බාල සහෝදරයාට ය.
   (4) මාමාගෙන් පසු බෑනාට ය.

21. ක්‍රිස්තු වර්ෂ 1602 දී 1වන විමලධර්මසූරිය රජතුමා හමුවීමට පැමිණි ලන්දේසි ජාතික දූතයා කවුරුන්ද?
    (1) ජොරිස් වැන් ස්පිල්බර්ජන්    (2) සිබල් ද වර්ට්
    (3) වෙස්ටර්වල්ඩ්    (4) කොන්ස්තන්තීනු ද සා

22. සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සූර්යයා වටා ඉලිප්සාකාරව ගමන් කරන බව සොයා ගන්නා ලද්දේ,
    (1) අයිසෙක් නිව්ටන් ය.    (2) ගැලීලියෝ ගැලීලි ය.
    (3) නිකලස් කොපර්නිකස් ය.    (4) ජොහැන්නස් කෙප්ලර් ය.

23. පහත A – E දක්වා ඇති තොරතුරු වලින් දේශ ගවේෂණ ව්‍යාපාරය සාර්ථක කරගැනීමට බලපෑ හේතු පමණක් දැක්වෙන පිළිතුර කුමක්ද ?
    A. මාලිමා යන්ත්‍රය සහ උතුරු තරු මාපකය නිපදවීම.
    B. මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ වැදගත් තොරතුරු සොයා ගැනීම.
    C. ටොලමිගේ ලෝක සිතියම.
    D. ගුරුත්වාකර්ෂණ නියමය සොයාගැනීම.
    E. ලෝකය ගෝලාකාර බව සොයා ගැනීම.

    (1) A, C හා E    (2) A, B හා D    (3) B, C හා E    (4) B, D හා E

24. යාපනය රාජධානියේ සිංහාසනය සම්බන්ධයෙන් උරුමකරුවන් අතර බල අරගලයක් ආරම්භ වන්නේ
    (1) පෘතුගීසීන් විසින් එදිරිමානසිංහම් යාපනය සිංහාසනයට පත් කිරීම නිසා ය.
    (2) කතෝලික පූජකවරු විසින් සංකිලි රජු බලයෙන් පහ කිරීමට පෘතුගීසීන්ගේ ආධාර පැතීම නිසා ය.
    (3) පුවිරාජ පණ්ඩාරම් නම් කුමරා සංකිලි රජු බලයෙන් පහ කර යාපනයේ බලය අල්ලා ගැනීම නිසා ය.
    (4) පරරාජසේකරම් රජු නොරපා සංකිලි කුමරු යාපනයේ බලය අයත් කර ගැනීම නිසා ය.

25. යකඩ වල ඇති අපද්‍රව්‍ය ඉවත් කර වානේ නිපදවීමට හැකි උඳුන සොයා ගන්නා ලද්දේ කවුරුන් විසින්ද ?
    (1) රිචඩ් ආක්රයිට්    (2) ජේම්ස් හාග්‍රීව්ස්    (3) හෙන්රි බෙසමර්    (4) සැමුවෙල් මෝස්

- පහත A සිට D දක්වා දී ඇති තොරතුරුවලින් 26 හා 27 ප්‍රශ්න සඳහා පිළිතුරු තෝරන්න.
    A - පරිසර දූෂණය
    B - මුඩුක්කු හා පේලි නිවාස ඉදිවීම
    C - කර්මාන්තශාලා නිසා රැකියා අවස්ථා බිහිවීම
    D - මුදල් හා බැංකු කටයුතුවල වර්ධනය

26. කාර්මික විප්ලවයේ අයහපත් ප්‍රතිඵල පමණක් සඳහන් පිළිතුර වන්නේ,
    (1) A හා C    (2) C හා D    (3) A හා D    (4) A හා B

27. කාර්මික විප්ලවයේ යහපත් ප්‍රතිඵල පමණක් අඩංගු පිළිතුර වන්නේ,
    (1) A හා C    (2) A හා B    (3) C හා D    (4) A හා C

28. ඕලන්දයේ V වන විලියම් රජතුමා විසින් කිව් ලිපිය එවන ලද්දේ මෙරට සිටි කුමන ලන්දේසි ආණ්ඩුකාරවරයාට ද ?
    (1) ෆන් එංගල්බෙක්    (2) ෆන් එක්    (3) ෆන් හුන්ක්    (4) ෆන් විලියම්

29. ක්‍රිස්තු වර්ෂ 1815 උඩරට ගිවිසුමේ පස්වන වගන්තියෙන් දැක්වෙන්නේ කුමන කරුණ පිළිබඳවද ?
    (1) උඩරට රදලයන් සතු බලතල ආරක්ෂා කරන බව
    (2) අධිකරණ කටයුතු ආණ්ඩුකාරවරයා යටතේ පවත්වාගෙන යන බව
    (3) බුද්ධාගම හා දේවාගම කඩ නොකොට ආරක්ෂා කිරීම පිළිබඳව
    (4) ශ්‍රී වික්‍රමරාජසිංහ රජුට හෝ නායක්කාර ඥාතීන්ට උඩරට සිංහාසනය අහිමි බව

30. ක්‍රිස්තු වර්ෂ 1818 නිදහස් අරගලය සඳහා බලපෑ ආසන්නතම හේතුව වන්නේ
(1)ඉංග්‍රීසින් විසින් බුද්ධදහම නොසලකා හැරීම යි.
(2) ඉංග්‍රීසින් හා මහජනතාව අතර ඇති වූ දුරස්ථ භාවය යි.
(3) මඩිගේ මුහන්දිරම් තනතුර සඳහා මුස්ලිම් ජාතිකයෙක් පත් කිරීම යි.
(4) ඉංග්‍රීසීන් යටතේ දේශීය සම්ප්‍රදායන් හා සංස්කෘතිය විනාශ වෙතැයි ජනතාව බියට පත්වීම යි.

- පහත A, B, C හා D දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවය පරීක්ෂා කර බලා අංක 31 සිට 33 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. - 1. ප්‍රසිද්ධ වාද විවාද පැවැත්වීම
2. පානදුරාවාදය

B. - 1. පොන්නම්බලම් රාමනාදන් මහතා
2. උගත් ලාංකික මන්ත්‍රීවරයා

C. - 1. කොළඹ සහිරා විද්‍යාලයේ විදුහල්පති
2. සිද්දි ලෙබ්බේ මහතා

D. - 1. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා
2. ගාල්ල මහින්ද විද්‍යාලය

31. පළමුවැන්නේ ප්‍රතිඵලයක් ලෙස දෙවැන්න බිහිවූ බව දැක්වෙන යුගලය වන්නේ
(1) D (2) C (3) B (4) A

32. පළමුවැන්න හා දෙවැන්න අතර සබඳතාවයක් නොමැති පිළිතුරු යුගලය වන්නේ
(1) C (2) A (3) D (4) B

33. දෙවැන්නේ සාර්ථකත්වය සඳහා පළමුවැන්න බලපෑ බව
(1) D (2) A (3) C (4) B

- බ්‍රිතාන්‍යයන් විසින් මෙරටට හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල ලක්ෂණ කිහිපයක් පහත සඳහන් කර ඇත. එම ලක්ෂණ මත පදනම්ව 34 හා 35 ප්‍රශ්නවලට අදාළ පිළිතුර තෝරන්න.

A. දිවයින පළාත් පහකට බෙදීම.
B. ද්වීමණ්ඩල පාර්ලිමේන්තුව.
C. ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම.
D. පළාත් බද නියෝජන ක්‍රමය හඳුන්වා දීම.

34. කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දුන් යෝජනා මොනවාද ?
(1) A හා B (2) A හා C (3) B හා D (4) C හා D

35. මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ ලක්ෂණයක් වන්නේ
(1) A (2) C (3) B (4) D

36. ඉංග්‍රීසීන්ගේ පොපිමල් ව්‍යාපාරයට එරෙහිව බිහි වූ සූරියමල් ව්‍යාපාරයෙන් ඉපයූ මුදල් වියදම් කරන ලද්දේ කුමන කාර්යයක් සඳහාද ?
(1) දේශීය යුධ භටයන්ගේ සුභසාධනය සඳහා
(2) මෙරට දුප්පත් ජනතාවගේ සුභසාධනය සඳහා
(3) මෙරට ඉංග්‍රීසි අධ්‍යාපනය නගා සිටුවීම සඳහා
(4) දේශීය කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා

37. ශ්‍රී ලංකාවේ රබර් පර්යේෂණ ආයතනය පිහිටුවා ඇති ප්‍රදේශය නම් කරන්න
(1) තලවකැලේ (2) ලුණුවිල (3) අගලවත්ත (4) ගම්පොළ

38. මෙරට නාගරික වතු කම්කරුවන්ගේ වෘත්තීය අයිතිවාසිකම් උදෙසා නායකත්වය ලත් පුද්ගලයා වූයේ
(1) ඩී. බී. ජයතිලක ය.
(2) රොබට් ගුණවර්ධන ය.
(3) නඩේස අයියර් ය.
(4) ඒ.ඊ. ගුණසිංහ ය.

39. බ්‍රිතාන්‍ය පාලනය නිසා උරුම වූ අහිතකර බලපෑමක් වන්නේ
(1) අපනයන වැවිලි බෝග හඳුන්වාදීම යි.
(2)පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රම ලැබීම යි .
(3) කාර්මික විප්ලවයේ බලපෑම මෙරටට ලැබීම යි.
(4) ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම යි.

40. සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ අගමැතිවරයා සතුව තබාගත යුතු වූ අමාත්‍යාංශ දෙක මොනවාද?.
(1) අධ්‍යාපන හා සෞඛ්‍ය කටයුතු
(2) අධිකරණ හා ආර්ථික කටයුතු
(3)ආරක්ෂක හා අධිකරණ කටයුතු
(4) ආරක්ෂක හා විදේශ කටයුතු

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2025
இரண்டாம் தவணைப் பரீட்சை - 2025/ Second Term Test - 2025

35015

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | ඉතිහාසය - II | කාලය / நேரம் / Time: පැය 03 යි විනාඩි 10 |

නම / பெயர் / Name ........................................................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ...................................

සැලකිය යුතුයි :-

- I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

1) (අ). පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) මාගම, මින්නේරිය, කෝනේශ්වරම්, කුරුණෑගල, ගෝඨපබ්බත, කන්තරෝඩය, කැලණි ගඟ, පිදුරංගල, යාන්ඔය, පොම්පරිප්පු, මාදුරුඔය ජලාශය, කයිට්ස් දූපත

(ලකුණු 12)

(ii) ලන්ඩන්, බොම්බාය, අරාබි මුහුද, තායිවානය, කල්කටා, මලක්කා සමුද්‍ර සන්ධිය.

(ලකුණු 06)

(ආ). (i) පහත A,B,C,D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. අතීත ශ්‍රී ලංකාවේ රජුට සම්පව කටයුතු කළ නිලධාරීන් හැඳින්වූ නම.
B. යාපහුව රාජධානි සමයේ දළදා වහන්සේ ඉන්දියාවට රැගෙන ගිය පාණ්ඩ්‍ය ආක්‍රමණිකයා.
C. ක්‍රිස්තු වර්ෂ 1865 දී ලංකා සංගමය පිහිටුවීම සඳහා මූලිකත්වය ගත් පුද්ගලයා.
D. ක්විනින් නැමැති ඖෂධය සකස් කිරීම සඳහා යොදා ගන්නා ලද බෙහෙත් පැළෑටිය.

(ලකුණු 04)

(ii) A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.



A රූපය

1. A රූපයේ දැක්වෙන්නේ කුමක්ද?
2. මෙය අයත් වන්නේ කුමන රාජධානි සමයකටද?
3. මෙම රූපය දක්නට ලැබෙන විහාරය නම් කරන්න.
4. එම විහාරය පිහිටා ඇති පළාත කුමක් ද?

(ලකුණු 04)

1. B රූපයේ දැක්වෙන්නේ කවුරුන්ද?
2. මොහු කිනම් ජාතිකයෙක්ද?
3. මොහු විසින් ප්‍රථමයෙන් ආරම්භ කරන ලද පාසල නම් කරන්න.
4. ඔහු විසින් ආරම්භ කරන ලද පුවත්පත නම් කරන්න.

(ලකුණු 04



B රූපය

## II කොටස

2. (i) ගල් යුගයට අයත් ප්‍රජාව ජීවත් වූ පරිසර කලාප තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)
   (ii) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන්කර හඳුනා ගැනීමට ඉවහල් වන සාධක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)
   (iii) a. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය කෙරෙහි බලපෑ සාධක තුනක් නම් කරන්න.
   b. ඉන් එක් සාධකයක් ජනාවාස ව්‍යාප්තිය කෙරෙහි බලපෑ ආකාරය පැහැදිලි කරන්න.
   (ලකුණු 05)
   (iv) මුල් ඓතිහාසික යුගයේ ශ්‍රී ලංකාවේ පැවති ජනාවාස වල ස්වරූපය පහත සඳහන් කරුණු යටතේ පැහැදිලි කරන්න.
   A. ජනාවාස වල ව්‍යාප්තිය
   B. සංවිධානය හා පරිපාලනය ක්‍රියාත්මක වූ ආකාරය (ලකුණු 06)

3. (i) දහතුන් වන සියවස වන විට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ දකුණු ඉන්දියානු වෙළඳ සංවිධාන තුනක් නම් කරන්න. (ලකුණු 03)
   (ii) පහත A,B,C හා D යටතේ දක්වා ඇති ප්‍රකාශ සඳහා අදාල පිළිතුරු අනුපිළිවෙලින් ලියා දක්වන්න.
   A. තොටබොජක නම් පරුමකයා පිළිබඳව සඳහන් වන සෙල්ලිපිය.
   B. ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත කිරීමේ ක්‍රියාවලියේ ආරම්භක පාලකයා.
   C. අතීතයේදී නීතිය පිළිබඳ හසල දැනුමක් ඇති පුද්ගලයන් හැඳින්වූ නම.
   D. හේන් ගොවිතැනේ දී අයකරන ලද කැතිඅඩ හා කෙටු කනබ යන බදු අහෝසි කරන ලද පාලකයා.

   (ලකුණු 04)
   (iii) පළමු වන විජයබාහු රජු ශ්‍රී ලංකාවේ දේශපාලන ස්ථාවරත්වයක් සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග කරුණු දෙකක් මගින් විස්තර කරන්න. (ලකුණු 05)
   (iv) ශ්‍රී ලංකාවේ පාලකයන් අතීතයේ දී විදේශීය රටවල් සමග පවත්වන ලද සුහදශීලී සබඳතා උදාහරණ තුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

4. (i) පහත සඳහන් පාලකයන් විසින් ඉදිකරන ලද වාරි කර්මාන්ත වරහන් තුළින් තෝරා ලියන්න.
   A. වසභ රජු B. මහසෙන් රජු C. ධාතුසේන රජු
   (යෝධ වැව, හිරිවඩුන්න වැව, කන්තලේ වැව, කවුඩුල්ල වැව) (ලකුණු 03)
   (ii) අතීතයේදී වැව් පද්ධතියක් (එල්ලංගාව) ඉදිකිරීමෙන් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වූ අරමුණු දෙක නම් කරන්න.

   (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක තාක්ෂණයේ මුල් අවස්ථා පහත සඳහන් කරුණු යටතේ පැහැදිලි කරන්න.

A. නිවාස ඉදිකිරීමේ තාක්ෂණය.

B. මැටි බඳුන් තැනීම. (ලකුණු 05)

(iv) වැවක දක්නට ලැබෙන තාක්ෂණික අංග දෙකක් නම් කර ඒවායේ නිර්මාණය සහ කාර්යය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 06)

5. (i) උඩරට රාජධානිය පාලනය කළ නායක්කර් වංශික රජවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

(ii) උඩරට රාජධානිය තුළ රජතුමා විසින් ම විසඳන ලද නඩු වර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පෘතුගීසීන් උඩරට රාජධානිය අල්ලා ගැනීම සඳහා ගත් උත්සාහයන් සියල්ලම අසාර්ථක වීම කෙරෙහි බලපෑ සාධක දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මහනුවර රාජධානියේ පරිපාලනය සංවිධානය වී තිබූ ආකාරය කරුණු තුනක් මගින් විස්තර කරන්න. (ලකුණු 06)

6. (i) පහත A, B, C යටතේ දක්වා ඇති කාර්යයන් සම්බන්ධ පුද්ගලයන් කවුරුන් දැයි අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A. ක්‍රිස්තු වර්ෂ 1815 උඩරට ආක්‍රමණයට පසුබිම සකස් කළ ඉංග්‍රීසි සිවිල් සේවකයා.

B. ක්‍රිස්තු වර්ෂ 1848 නව බදු වර්ග රැසක් පැනවූ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා.

C. ක්‍රිස්තු වර්ෂ 1908 වර්ෂයේ මුල්වරට විධිමත් පෙත්සමක් යටත් විජිත ලේකම් වෙත ඉදිරිපත් කළ පුද්ගලයා. (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමල වරාය කෙරෙහි ඉංග්‍රීසීන්ගේ අවධානය යොමු වීමට බලපෑ කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) බ්‍රිතාන්‍යයන් විසින් උඩරට රාජධානිය ආක්‍රමණය කිරීම කෙරෙහි බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ක්‍රිස්තු වර්ෂ 1848 දෙවන නිදහස් සටනට බලපෑ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

7. (i) පහත සඳහන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යටතේ ව්‍යවස්ථාදායකය හැඳින්වීම සඳහා භාවිත කළ නම මොනවාද ?

A. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය.

B. 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

C. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. (ලකුණු 03)

(ii) පහත සඳහන් දේශපාලන පක්ෂ ආරම්භ කරන ලද්දේ කවුරුන් විසින්ද ?

A. එක්සත් ජාතික පක්ෂය. B. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය.

C. කම්කරු පක්ෂය. D. ෆෙඩරල් පක්ෂය.

(ලකුණු 04)

(iii) A. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දෙන ලද ඡන්ද විමසීමේ ක්‍රම තුන නම් කරන්න.
B. ඉන් එක් ඡන්ද විමසීමේ ක්‍රමයක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) නිදහසින් පසු උදාවූ දශක තුනක පමණ කාලයක් තුළ ශ්‍රී ලංකාවේ කාර්මීකරණ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

## III කොටස

8. (i) පුනරුද සමයේ එංගලන්තයේ බිහිවූ මානවවාදී කතුවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A, B, C, D යටතේ දක්වා ඇති නිර්මාණ ලොවට දායාද කළ පුද්ගලයන් නම් කරන්න.

A. මොනාලිසා චිත්‍රය B. දාවිත් ගේ ප්‍රතිමාව
C. මුද්‍රණ යන්ත්‍රය D. දුරදක්නය (ලකුණු 04)

(iii) පුනරුදය නිසා යුරෝපයේ ඇති වූ දේශපාලන වෙනස්කම් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) යුරෝපා පුනරුදයේ බලපෑම තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංස්කෘතික ක්ෂේත්‍රයන්හි ඇති වූ වෙනස්කම් තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

9. (i) බ්‍රිතාන්‍යයේ ගල් අඟුරු ව්‍යාප්තව පැවති ප්‍රදේශ තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) දහනව වන සියවස වන විට කාර්මික විප්ලවය වෙනත් රටවල් කරා ව්‍යාප්ත වීමට බලපෑ ප්‍රධාන හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) කාර්මික විප්ලවය බ්‍රිතාන්‍ය තුළින් ම ආරම්භ වීම කෙරෙහි බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) කාර්මික විප්ලවය නිසා ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව කරුණු තුනක් මගින් විස්තර කරන්න. (ලකුණු 06)

**දෙවන වාර පරීක්ෂණය 2025 ඉතිහාසය 11 ශ්‍රේණිය**

**පිළිතුරු පත්‍රය**

**I පත්‍රය**

| | | | |
|---|---|---|---|
| (1). 1 | (11). 1 | (21). 1 | (31). 1 |
| (2). 2 | (12). 1 | (22). 4 | (32). 1 |
| (3). 2 | (13). 2 | (23). 1 | (33). 2 |
| (4). 4 | (14). 3 | (24). 3 | (34). 2 |
| (5). 1 | (15). 3 | (25). 3 | (35). 4 |
| (6). 2 | (16). 4 | (26). 4 | (36). 2 |
| (7). 1 | (17). 2 | (27). 3 | (37). 3 |
| (8). 3 | (18). 1 | (28). 1 | (38). 4 |
| (9). 2 | (19). 2 | (29). 3 | (39). 4 |
| (10). 4 | (20). 4 | (30). 3 | (40). 4 |

**II පත්‍රය**

1. (ආ) (i) A. රද්කොල් සම්දරු

B. ආර්ය චක්‍රවර්ති

C. ජෝර්ජ් වෝල්

D. සිංකෝනා

(ii) A රූපය

1. ප්‍රණීත ආහාර බුදින පිරිසක්

2. උඩරට රාජධානි සමයට

3. මුල්ගිරිගල විහාරයේ

4. දකුණු පළාත

B රූපය

1. ආරුමුග නාවලර්තුමා

2. ද්‍රවිඩ ජාතිකයෙකි

3. වන්නපොනෙයි ශෛව ප්‍රකාශ විද්‍යාලය

4. උදය භානු

2. (I) * අර්ධ ශුෂ්ක කලාපය

* පහතරට වියලි කලාපය

* පහතරට අතරමැදි වියළි කලාපය

* තෙත් කලාපය

* කඳුකර වියළි අතරමැදි කලාපය

* ශුෂ්ක කලාපය

(ii) *පිළිස්සූ මැටි වලං භාවිතය ආරම්භ කිරීම

* ක්‍රමවත් සුසාන චාරිත්‍ර විදියක් අනුගමනය කිරීම

* යකඩ ලෝහ භාවිත කිරීම

* ස්ථිර ජනාවාස ඉදිකිරීම

* කෘෂි කර්මාන්තය ඇරඹීම

(iii) A. * වාර්ෂික වර්ෂාපතන අගය

*පසේ ස්වභාවය

*භූ විෂමතාව

* ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය

* ජල වහනය

B. 10 ශ්‍රේණිය පෙළපොත 23 පිටුව

(සුදුසු ආකාරයේ පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න)

(iv) A *ගංගා නිම්නවල නොව ඊට පිටතින් පිහිටි ප්‍රදේශවල ජනාවාස පැතිරීම

* වැවක් කේන්ද්‍ර කරගෙන ජනාවාස බිහිවීම

* වැටකින් ආරක්ෂිත වූ ගම් සහ වැටකින් ආරක්ෂිත නොවූ ගම්

* පටු කැලෑ තීරයකින් ගම් වෙන් වීම

* කාර්ය පදනම් කරගෙන ක්‍රියාත්මක වූ ගම්

B. *ගමක් යනු පවුල් කිහිපයකින් සැදුම්ලත් ඒකකයක් බව පැවසීම

* ගෘහපතියන්

* ගමික

* දසගම් ඇත්තන්

පිළිබඳව විස්තර ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න

(10 ශ්‍රේණිය පෙළපොත 24, 25, 26 පිටු)

3. (i) *නානාදේසි

*වලඤ්ඤියාර්

*අයින්නුරුවන්

(ii) A. කොත් ගල් කන්ද

B. පණ්ඩුකාභය රජතුමා

C.වොහාර

D.නිශ්ශංක මල්ල රජතුමා/ කීර්ති ශ්‍රී නිශ්ශංක මල්ල

(iii) *චෝලයන්ගෙන් රට නිදහස් කර ගැනීම

* අනුරාධපුරය වෙනුවට පොළොන්නරුව සිය පාලන මධ්‍යස්ථානය බවට පත්කර ගැනීම

* රට පරිපාලන ඒකක වලට බෙදා පාලනය කිරීම

(iv) *රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා මත පළමුවන ගජබාහු රජතුමා පත්තිනි දේවාලයක් විවෘත කිරීමට ඉන්දියාවේ චේර රාජ්‍යයට පැමිණීම

* භාතිකාභය රජතුමා රුවන්වැලි සෑය අලංකාර කිරීමට වීදුරු පබළු ගෙන ඒම සඳහා රෝමයට තානාපතිවරු යැවීම

* හයවන අග්ග බෝධි රජු සමයේ විසි වතාවක් ලංකාවෙන් චීනයට වෙළෙඳ හා සංස්කෘතික සබඳතා සඳහා දූතයන් යැවීම

* පළමු වන විජයබාහු රජතුමා කාලිංග දේශයෙන් තිලෝකසුන්දරී විවාහ කර ගැනීම සහ තම නැගණිය මිත්තා කුමරිය පාණ්ඩ කුමාරයෙකුට විවාහ කරදීම

* පළමු වන විජයබාහු රජතුමා දළදා මාලිගාවේ ආරක්ෂාවට වේළක්කාර හමුදාව පත්කිරීම

* ක්‍රිස්තුවර්ශ දහය වන සියවසෙන් පසු අරාබි රටවල් සමඟ සබඳතා ගොඩනඟා ගැනීම

(10 ශ්‍රේණිය පෙළපොත හතළිස් 46,47 පිටු)

4. (i) A හිරිවඩුන්න වැව

B කවුඩුල්ල වැව

C යෝධ වැව

(ii) * භූමියක ඉහළින් පිහිටි වැවක් වැසි දියෙන් පිරුණු විට ඉන් බැහැරට ගලා යන ජලය පහළින් ඇති වැවට හරවා ජලය සංරක්ෂණය කර ගැනීම

* වැව් දෙකක් අතර ඇල මාර්ගයේ නිරන්තරයෙන් ජලය ගලා යාමට සලස්වා ඇළ දෙපස භූමියේ තෙතමනය ඉහළ දැමීම

(iii) A. *උඩරංචාමඩම ගම්මානයේ පිහිටි නිවාසයෙහි නටඹුන් ඇසුරෙන් පිළිතුර සකසා ඇත්නම් ලකුණු ලබා දෙන්න

B. * සකපෝරුව භාවිතයෙන් මැටි බඳුන් සෑදූ ආකාරය

* කාලරත්ත වර්ණ මැටි බඳුන්

* පිංතාරු කළ මැටි බඳුන

* (10 ශ්‍රේණිය පෙළපොත 64/65 පිටු)

(iv) * වැව් බැම්ම, රළ පනාව, සොරොව්ව, බිසෝ කොටුව, පිටවාන, ඇතුළුවාන

*නම් කරන ලද තාක්ෂණික අංගවල නිර්මාණය සහ කාර්යය පිළිබඳ විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න

5. (i) *ශ්‍රී විජය රාජසිංහ

* කීර්ති ශ්‍රී රාජසිංහ

* රාජාධි රාජසිංහ

*ශ්‍රී වික්‍රම රාජසිංහ

(ii) *වැදගත් නායකයන් සම්බන්ධ නඩු

*රාජ ද්‍රෝහිත්වය පිළිබඳව නඩු

*කැරලි කෝලාහල පිළිබඳ නඩු

*කුමන්ත්‍රණ නඩු

*විහාර හා භික්ෂූන් සම්බන්ධ නඩු

(iii) *උඩරට ජනතාව හැමවිටම රජුට සහාය දීම

* පෘතුගීසීන් වෙනුවෙන් සටන් කිරීමට ගිය පහත රැටියන් උඩරට දී රජුට එකතුවීම

*උඩරැටියන්ගේ සටන් උපක්‍රම හා රජවරුන්ගේ උපාය කෞශල්‍යය

* උඩරට රාජධානියේ ස්වභාවික පිහිටීම

(iv) *රජුගේ බලය

* අධිකාරම්වරු

*මහවාසල හෙවත් මාලිගාව සතු නිලධාරීන්

*රටවසම හෙවත් ප්රදේශ පාලනය

* බද්දේ සංවිධාන

* විහාර දේවාල පාලන කටයුතු

* අධිකරණ කටයුතු

6. (i) A ජෝන් ඩොයිලි

B ටොරින්ටන් සාමිවරයා

C ජේම්ස් පීරිස් මහතා

(ii) * ත්‍රිකුණාමල වරාය බෙංගාල බොක්කට මුහුණලා පිහිටා තිබීම

* ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ ඉංග්‍රීසි නාවික බලය රැක ගැනීමට එම වරායේ පිහිටීම වැදගත් වීම

* ඊසාන දිග මෝසම් සුළං කාලයේ නැව් ආරක්ෂා කර ගැනීමට ත්‍රිකුණාමල වරාය යොදාගත හැකිවීම

(iii) * වෙරළබඩ ප්‍රදේශ ආරක්ෂා කිරීමට හමුදා යෙදවීමට අමතරව අභ්‍යන්තර දේශසීමා ආරක්ෂාවට ද ඉංග්‍රීසි හමුදා යෙදවිය යුතු වීම

* මුහුදුබඩ ප්‍රදේශවල වැසියන් පවා උඩරට රජු තම රජු ලෙස සැලකීම

* මුහුදුබඩ ප්‍රදේශවල කැරලි ඇති වූ විට උඩරට රජු කැරළිකරුවන්ට සහාය දීම

* උඩරට රාජ්‍ය විසින් ඉංග්‍රීසීන්ගේ සතුරන් වූ ප්‍රංශ ජාතිකයන්ගෙන් උදව් ඉල්ලා සිටීවි යැයි ඉංග්‍රීසීන් බියවීම

* කොළඹ පාලන මධ්‍යස්ථානයේ සිට ප්‍රධාන නාවික මධ්‍යස්ථානය වූ ත්‍රිකුණාමලය සමඟ ගොඩබිමින් සබඳතා පැවැත්වීමට උඩරට රාජ්‍යයේ බල ප්‍රදේශය හරහා ගමන් කළ යුතු වීම

(iv) *රජයේ ඉඩම් ප්‍රතිපත්තිය

*ගම් සභාව අඩපණවීම

*නව අධිකරණ ක්‍රමය

* රාජ්‍ය හා මහජනතාව අතර සබඳතාව දුරස්වීම

7. (i) A. රාජ්‍ය මන්ත්‍රණ සභාව

B. ජාතික රාජ්‍ය සභාව

C. පාර්ලිමේන්තුව

(ii) A.- D.S. සේනානායක මහතා

B. - S.W.R.D. බණ්ඩාරනායක මහතා

C. - A.E. ගුණසිංහ මහතා

D. - S.J.V. චෙල්වනායගම් මහතා

(iii) A -* ජනාධිපතිවරණය

* සමානුපාතික නියෝජන ක්‍රමය

* ජනමත විචාරණය

B - * මහජන බැංකුව පිහිටුවීම හා කුඩා කර්මාන්තකරුවන්ට ණය පහසුකම් සලසා දීම

* දේශීය කාර්මික නිෂ්පාදනවල ප්‍රමිතිය තීරණය කිරීමට ප්‍රමිති කාර්යාංශයක් පිහිටුවීම

* ඒකල හා රත්මලාන කාර්මික ජනපද පිහිටුවීම

* රජය කාර්මික ප්‍රතිපත්ති නිසා 1960න් පසුව මෙරටට අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ කර්මාන්තවල දියුණුවක් ඇතිවීම

* 1970 – 1977 කාලයේ රජය අනුගමනය කළ ආයාත ආදේශක ප්‍රතිපත්තිය නිසා දේශීය ගෘහස්ථ කර්මාන්ත හා සුළු කර්මාන්ත දියුණු වීම

* මහා පරිමාණ කර්මාන්ත පවත්වාගෙන යාම රජයේ මැදිහත්වීමෙන් සිදුවිය
(උදාහරණ - සිමින්ති, යකඩ හා වානේ, තුනී ලෑලි, සීනි )

(ශ්‍රේණිය පෙළ පොත- පිටු අංක 106 / 107 )

8. i. *තෝමස් මුවර්

*ෆ්‍රැන්සිස් බේකන්

*විලියම් ෂේක්ස්පියර්

ii. A. ලියනාඩෝ ඩාවින්චි

B. මයිකල් ආන්ජලෝ

C. ජොහැන්නස් ගුටන්බර්ග්

D. ගැලීලියෝ ගැලීලි

iii. *ජාතික රාජ්‍ය බිහිවීම

* මධ්‍යම පංතියක් බිහිවීම

* ඉඩම් හිමි වංශාධිපතිවරුන්ගේ බලතල හා අයිතිවාසිකම් ගිලිහීම

iv. <u>ආර්ථික</u>

* ලංකාව හා යුරෝපය අතර ඍජු වෙළඳ සම්බන්ධතා ආරම්භ වීම

* වතු වගාව ප්‍රචලිත වීම ( ලන්දේසි - කුරුඳු , බ්‍රිතාන්‍ය - කෝපි, කොකෝවා, සිංකෝනා, තේ, රබර් )

* වානිජ ආර්ථික රටාවකට හුරුවීම නිසා පැවති ග්‍රාමීය ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය බිඳ වැටීම

* ලංකාවේ ආනයන අපනයන ආර්ථිකය බිහිවීම

* මුදල් භාවිතය ප්‍රචලිත වීම

* දුම්රිය මාර්ග මහා මාර්ග පද්ධතිය ඉදිවීම

* වෙළඳ නගර බිහිවීම ( උදාහරණ - කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය)

* මධ්‍යම පංතියක් බිහිවීම

<u>සමාජ සංස්කෘතික වෙනස්කම්</u>

* මුද්‍රණ කර්මාන්තය හඳුන්වාදීම

* බටහිර චින්තනය මෙරටට ලැබීම

* යුරෝපයේ පැවැති ආගමික නිකායන් මෙරට පැතිරීම

* යුරෝපීය වාස්තු විද්‍යාව

9. i. දකුණු වේල්ස්, යෝක්ෂයර්, ලැන්කැෂයර්

ii. * ලොව පුරා ජනගහනය සීඝ්‍රයෙන් වර්ධනය වීම නිසා භාණ්ඩවලට තිබූ ඉල්ලුම ඉහළ යාම

* යුරෝපය තුළ ගමනාගමනය හා ප්‍රවාහන කටයුතුවල වර්ධනය

* ප්‍රංශය හා ජර්මනිය ගල් අඟුරු සොයා ගැනීම

iii. * ජනගහන වර්ධනය අධික වීම

* වෙළඳාම නිසා මුදල් ආයෝජනය කළ හැකි ධනවතුන් පිරිසක් බිහිවීම

* ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය

* ආකල්පමය වශයෙන් පැවති නිදහස් සමාජ පසුබිම

* බ්‍රිතාන්‍යයේ පැවති දේශපාලන ස්ථාවරත්වය

iv. * මාර්ග පහසුකම් දියුණු වීම ( මැකඩම් ක්‍රමය )


* ජෝර්ජ් ස්ටිවන් - වාෂ්ප දුම්රිය එන්ජිම

* රොබට් ෆුල්ටන් - දුම්බෝට්ටුව

* ඩෙම්ලර් - මෝටර් රථය

* රයිට් සහෝදරයෝ - ගුවන් යානය

01. i .



ii.

